# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2193/10 - 2020 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2020.09.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු ආඥා පනත යටතේ නිවේදනයයි**

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2020)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2020 සැප්තැම්බර් මස 10 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල,<br>
ලේකම්,<br>
මුදල් අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 15 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වන අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.


1A - G 32984 — 54 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | ප්‍රමාණ ඒකකය |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **27.10** | | | අශුද්ධ තත්ත්වයේ හැර, පැට්‍රොලියම් තෙල් වර්ග සහ ගල්කීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාලත් තෙල් වර්ග ; බරෙන් 70%කට නොඅඩුව පැට්‍රොලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන්කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග ; වේස්ට් ඔයිල්. | | | |
| | | | | | | |
| | 2710.19.70 | --- | ස්නේහක නිපදවීමට ගන්නා ලිහිසිතෙල් (මූලික තෙල්) | | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 45.00 | කි.ග්‍රෑ. |
| | 2710.19.80 | --- | ස්නේහක තෙල් | | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 115.00 | කි.ග්‍රෑ. |
| | | | | | | |
| 34.03 | | | (ස්නේහක පදනම් කොටගත්, කැපුම්-තෙල් සකස් කිරීම්, ඇණ මුරිච් ගැලවීමේ සකස් කිරීම්, මළනාශක හෝ විඛාදන නාශක සකස් කිරීම් සහ අච්චු ගැලවීමේ සකස් කිරීම් ඇතුළුව) බරින්70%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ ස්නේහක සකස් කිරීම් සහ ගල්කීලමය (බිටුමිනස්) ඛනිජ ද්‍රව්‍යවලින්ලබාගත් තෙල් හෝ පැට්‍රොලියම් තෙල් වර්ග මූලික සංඝටක වශයෙන් අඩංගුව ඇති සකස් කිරීම් හැර, රෙදි පිළි, සම්, ලොම් සම් හෝ වෙනත් ද්‍රව්‍යයන්, තෙල් හෝ ග්‍රීස් ගල්වා සකස් කිරීම සඳහා, යොදාගනු ලබන වර්ගයකට අයත් සකස් කිරීම්. | | | |
| | | -- | ගල්කීලමය ඛනිජවලින් ලබාගත් තෙල් හෝ පෙට්‍රෝලියම් තෙල් අන්තර්ගත වූ ඃ | | | |
| | | | | | | |
| | 3403.19 | -- | අනෙකුත් | | | |
| | 3403.19.10 | --- | මෝටර් වාහන සඳහා භාවිත කරනු ලබන ලිහිසි තෙල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 50.00 | කි්.ග්‍රෑ. |
| | | | | | | |
| | | - | අනෙකුත් ඃ | | | |

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | ප්‍රමාණ ඒකකය |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| | 3403.99 | -- | අනෙකුත් | | | |
| | 3403.99.10 | --- | මෝටර් වාහන සඳහා භාවිත කරනු ලබන ලිහිසි තෙල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 50.00 | කි.ග්‍රෑ. |

10 - 352

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.